**විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම 2024.06.11**
**පළාත් ඉංජිනේරු කාර්යාංශය (බ.ප.)**

2024 වර්ෂයේ II කාර්තු වෙහි II වන විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම 2024.06.11 දින නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) කාර්යාලයේ දී පැවැත් වූ අතර එහි රැස්වීම් වාර්තාව පහත පරිදි ඉදිරිපත් කරමි.

2024.06.11 වන දින පෙ.ව.9.30 ට නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) කේ.ආර්.අබේසිරිවර්ධන මයාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වූ අතර එදින එතුමා විසින් පැමිණ සිටි සියළු නිලධාරීන් පිළිගෙන රැස්වීමේ කටයුතු ආරම්භ කෙරුණි.

**සහභාගී වූ නිලධාරීන්**

01. කේ.ආර්.අබේසිරිවර්ධන මයා - නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) - පළාත් ඉංජිනේරු කාර්යාංශය (බ.ප.)
02. ආර්.පී.ගුණවර්ධන මිය - අධ්‍යක්ෂ (ගොඩනැගිලි) - පළාත් ඉංජිනේරු කාර්යාංශය (බ.ප.)
03. ටී.කේ.ආර්.දිලේශිකා මිය - ප්‍රධාන ගණකාධිකාරි - පළාත් ඉංජිනේරු කර්යාංශය (බ.ප.)
04. එම්.කේ.සුගත් ද සිල්වා මයා - විගණන අධිකාරී - ජාතික විගණන කාර්යාලය.
05. එන්. එච්. සුමින්ද මයා - අධ්‍යක්ෂ ( ගිණුම් හා ගෙවීම්) - ප්‍රධාන ලේකම් කාර්යාලය.
06. ඩී.ඩී.චන්ද්‍රානි සෙනවිරත්න මිය - අභ්‍යන්තර විගණක - අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව (බ.ප.)
07. පී.එල්.ඩී.ඒ.එස්.පනාගොඩ මිය - අධ්‍යක්ෂ ඉංජිනේරු - පළාත් ඉංජිනේරු කාර්යාංශය (බ.ප.)
08. එල්.එම්.ඩී.ආර්.ද මෙල් මිය - ගණකාධිකාරි - පළාත් ඉංජිනේරු කාර්යාංශය (බ.ප.)
09. ජී.ඩී.විපුලසේන මිය - ප්‍රාදේශීය ඉංජිනේරු - බත්තරමුල්ල.
10. ඒ.කේ.රුවන් අලවත්ත මයා - ප්‍රාදේශීය ඉංජිනේරු - මීගමුව.
11. එෆ්.බී.සම්පත් මයා - ප්‍රාදේශීය ඉංජිනේරු - හොරණ.
12. එස්.ඩී.සේනාරත්න මිය - ප්‍රාදේශීය ඉංජිනේරු - පානදුර.
13. පී.ආර්.මධුරංග මයා - ප්‍රාදේශීය ඉංජිනේරු - මිනුවන්ගොඩ.
14. ඉනෝකා කොටඹගේ මිය - ප්‍රාදේශීය ඉංජිනේරු - බියගම.
15. එල්.ඩී.ගලබඩ මිය - ප්‍රාදේශීය ඉංජිනේරු - ගම්පහ.
16. ඒ.ඒ.ද සොයිසා මයා - ප්‍රාදේශීය ඉංජිනේරු - හෝමාගම.
17. ඩබ්.ජී.ආර්.වේලාතන්ත්‍රි මයා - ප්‍රාදේශීය ඉංජිනේරු - මතුගම.
18. එච්.එස්.චන්දන මයා - ප්‍රාදේශීය ඉංජිනේරු - වත්තල.
19. ඩී.සී.එන්.කලන්සූරිය මයා - ප්‍රාදේශීය ඉංජිනේරු - කළුතර.
20. ආර්.ඩබ්.සී.ගුණවර්ධන මිය - ප්‍රාදේශීය ඉංජිනේරු - රත්මලාන.
21. පී.ඩී.ආර්.නදීරා මිය - ප්‍රාදේශීය ඉංජිනේරු - කොළඹ.
22. කේ.කේ.පී.රණතුංග මිය - පරිපාලන නිලධාරි - පළාත් ඉංජිනේරු කාර්යාංශය(බ.ප.)
23. ඩබ්.අයි.නිලාන්ති මෙය - මුදල් සහකාර - පළාත් ඉංජිනේරු කාර්යාංශය(බ.ප.)
24. ඒ.ඒ.ඩී. ශ්‍යාමලි මිය - කළමනාකරණ සේවා නිලධාරි - පළාත් ඉංජිනේරු කාර්යාංශය (බ.ප.)
25. එල්.එස්.පී.පෙරේරා මිය - කළමනාකරණ සේවා නිලධාරි පළාත් ඉංජිනේරු කාර්යාංශය(බ.ප.)
26. ඩබ්.කේ.එම්.ඩී.එන්.කුලසේකර මෙය -කළමනාකරණ සේවා නිලධාරි-පළාත් ඉංජිනේරු කාර්යාංශය(බ.ප.)
27. ඒ.එල්.එම්.පෙරේරා මිය - කළමනාකරණ සේවා නිලධාරි - පළාත් ඉංජිනේරු කාර්යාංශය(බ.ප.)
28. කේ.ඩී.පී.ජයරත්න මිය - කළමනාකරණ සේවා නිලධාරි - පළාත් ඉංජිනේරු කාර්යාංශය(බ.ප.)

## 01. පසුගිය විගණන කමිටු වාර්තාවේ ප්‍රගතිය සාකච්ඡා කිරීම

<table>
<tr><th></th><th>කාරණය</th><th>සාකච්ඡා වූ කරුණු/ තීරණ</th><th>වගකීම</th></tr>
<tr><td>01</td><td>මාසික බැංකු සැසඳුම්</td><td>
මේ වන විට සියළුම කාර්යාල විසින් බැංකු සැසඳුම් මෘදු පිටපත නියමිත දින වන විට අභ්‍යන්තර විගණන කාර්යාලයට එවා ඇති බවත් ඒ ආකාරයෙන්ම දිගටම කරගෙන යන ලෙසත් අභ්‍යන්තර විගණක ප්‍රකාශ කරන ලදී.
බැංකු සැසඳුමේ මෘදු පිටපත පමණක් ඊලග මස 15 දිනට පෙර අභ්‍යන්තර විගණනය වෙත ඉදිරිපත් කරන ලෙස නැවතත් ප්‍රාදේශීය ඉංජිනේරුවරුන්ව දැනුවත් කරන ලදි.
2024.05.31 දින වන විටත් හය මස ඉක්ම වූ චෙක්පත් කාර්යාල 6 ක් පැවතුණි.
<table>
<tr><th rowspan="2">කාර්යාලය</th><th colspan="3">6 මස ඉක්ම වූ චෙක්පත්</th></tr>
<tr><th>චෙක්පත් ගණන</th><th>වටිනාකම රු.</th><th></th></tr>
<tr><td>කොළඹ</td><td>5</td><td>540,139.50</td><td></td></tr>
<tr><td>බත්තරමුල්ල</td><td>21</td><td>34,372,682.24</td><td></td></tr>
<tr><td>රත්මලාන</td><td>2</td><td>75,876.45</td><td></td></tr>
<tr><td>හෝමාගම</td><td>1</td><td>9,496,964.69</td><td></td></tr>
<tr><td>බියගම</td><td>2</td><td>40,938.46</td><td></td></tr>
<tr><td>පානදුර</td><td>1</td><td>49,995.00</td><td></td></tr>
</table>
ඉහත චෙක්පත් 2023 දෙසැම්බර් 31 ලියූ චෙක්පත් බවත්, එම චෙක්පත් වලින් බොහෝමයක් සමිති මඟින් සිදුකළ කොන්ත්‍රාත් වලට අදාළව එවා බවත් ප්‍රාදේශීය ඉංජිනේරු ප්‍රකාශ කරන ලදි. මෙම චෙක්පත් කඩිනමින් නිරවුල් කරන ලෙස අදාල ප්‍රාදේශීය ඉංජිනේරුවරුන් දැනුවත් කරන ලද අතර ලියන ලද චෙක්පත් මාස 02 ක් ඇතුලත නිරවුල් කිරීමටත් මෙම අඩුපාඩුව ඉදිරි වසරවල සිදුනොවීමට කටයුතු කරන ලෙසත්, සමිති සඳහා කොන්ත්‍රාත් දීම ගැටළුකාරි වන බැවින් හැකිතාක් පුවත්පත් දැන්වීම් මඟින් කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමට කටයුතු කරන ලෙසත් නි.ප්‍ර.ලේ. (ඉංජිනේරු) විසින් ප්‍රාදේශීය ඉංජිනේරුවරුන්ව දැනුවත් කරන ලදි.
</td><td>ප්‍රධාන ගණකාධිකාරි / ගණකාධිකාරි<br>සියළුම ප්‍රාදේශීය ඉංජිනේරුවරු</td></tr>
</table>

| | | | |
|---|---|---|---|
| 02 | අත්තිකාරම් 'බී' ගිණුමට අදාලව ණය අය නොවීම. | මෙතෙක් ණය ශේෂ නිරවුල් නොකර ඇති පළාත් පාලන ආයතන වෙත පළාත් පාලන කොමසාරිස් හා නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මුල්‍ය) ද පිටපත් සහිතව අදල පළාත් පාලන ආයතනයන් වෙත ණය ශේෂ නිරවුල් කරන ලෙස දන්වන ලදි.<br>මුද්දර ආදායම් ලබන පළාත් පාලන ආයතන වෙතින් එම ආයතන වෙත ලබාදෙනු ලබන මුද්දර ආදායම් වලින් මෙතෙක් අයවී නොමැති ණය ශේෂ නිරවුල් කර ගැනීමට ගරු ආණ්ඩුකාරතුමාගේ අවසරය ලැබී ඇති බැවින් පළාත් පාලන ආයතන වෙතින් තවදුරටත් නිරවුල් කර ගැනීමට නොහැකිව ඇති ණය සම්බන්ධව පළාත් භාණ්ඩාගාරය වෙත ඉල්ලීමක් කරන ලෙස අධ්‍යක්‍ෂ (ගිණුම් හා ගෙවීම්) ප්‍රකාශ කරන ලදි.<br>නොපියවා ඇති 2024.05.31 දිනට ණය අයවීම් පිළිබඳ වාර්තාව | ප්‍රධාන ගණකාධිකාරී / ගණකාධිකාරී |

| අනු අංකය | නිලධාරිගේ නම | තනතුර | ස්ථාන මාරුවී ගිය දිනය | 2024.05.31 දිනට අයවීමට ඇති ණය ශේෂය රු. |
|---|---|---|---|---|
| | පළාත් පාලන ආයතන වලට ස්ථාන මාරුවී ගිය නිලධාරින්ගෙන් අයවිය යුතු ණය ශේෂයන් | | | |
| 1 | ඒ.එස්.අමරසිංහ | කළ.සේවා. නිලධාරි | 2016.01.16 | ණය ශේෂය පියවා අවසන් |
| 2 | සී.කේ.තන්තුලගේ | රියදුරු | 2019.06.03 | රු.74,544.00 |
| | | 2024.04.26 හා 2024.06.05 දිනැති ලිපි මඟින් ණය ශේෂය පියවීමට කටයුතු කරන ලෙස ගම්පහ මහ නගර සභාවේ නාගරික කොමසාරිස් වෙත දන්වා ඇත. | | |
| 3 | ඩබ්.ඒ.ටී.එස්. වනිගසුන්දර | කළමනාකරණ සහකාර | 2020.01.01 | රු.118,350.00 |
| | | 2024.04.26 හා 2024.06.05 දිනැති ලිපි මඟින් ණය ශේෂය පියවීමට කටයුතු කරන ලෙස ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටෙ මහ නගර සභාවේ නාගරික කොමසාරිස් වෙත දන්වා ඇත. | | |
| 4 | ඩබ්.සී.එස්.පෙරේරා | කළමනාකරණ සහකාර | 2020.01.17 | ණය ශේෂය පියවා අවසන් |
| 5 | ඊ.එස්.ඊ.සිල්වා | තාක්ෂණ නිළධාරි | 2022.03.31 | ණය ශේෂය පියවා අවසන් |
| 6 | අයි.පී.ආර්.පෙරේරා | කළමනාකරණ සහකාර | 2020.02.17 | රු. 116,218 .00 |
| | | ණය ශේෂය නිරවුල් කිරීම සඳහා චෙක්පත එවා ඇති නමුත් එම චෙක්පතෙහි ආදායකයාගේ නම වැරදි බැවින් නම සංශෝධනය කර නැවත එවන ලෙස දන්වමින් 2023.12.28 දිනැතිව නැවත යවා ඇති නමුත්, මේ වන තෙක් නැවත ලැබී නොමැත. එබැවින් මේ පිළිබඳ විමසමින් 2024.04.18 වන දිනැතිව I වන සිහිකැඳවීම් ලිපිය යවා ඇත. | | |
| 7 | පී.ජී.එල්.ආලෝකා | තාක්ෂණ නිළධාරි | 2020.02.10 | රු.111,806.00 |
| | | 2024.04.26 හා 2024.06.05 දිනැති ලිපි මඟින් ණය ශේෂය පියවීමට කටයුතු කරන ලෙස මොරටුව මහ නගර සභාවේ නාගරික කොමසාරිස් වෙත දන්වා ඇත. | | |
| 8 | එන්.පී.ඩබ්. ජයවර්ධන | සංවර්ධන නිලධාරි | 2021.12.15 | ණය ශේෂය පියවා අවසන් |
| 9 | එස්.යු.විමලසිරි | කළමනාකරණ සහකාර | 2023.01.01 | රු.100,000.00 |
| | | 2024.04.26 හා 2024.06.05 දිනැති ලිපි මඟින් ණය ශේෂය පියවීමට කටයුතු කරන ලෙස මොරටුව මහ නගර සභාවේ නාගරික කොමසාරිස් වෙත දන්වා ඇත. | | |

| | | | | |
|---|---|---|---|---|
| 10 | ආර්.පී.එස්.විදුරංග | කළමනාකරණ සේවා නිලධාරි | 2023.07.17 | 214,961.00 |
| | | 2024.04.26 හා 2024.06.05 දිනැති ලිපි මඟින් ණය ශේෂය පියවීමට කටයුතු කරන ලෙස කොළඹ කැම්බල් උද්‍යානයේ දිසා කාර්යාලයේ පරිපාලන නිලධාරි (වැ.බ.)වෙත දන්වා ඇත. | | |
| | | | | 735,879.00 |
| | රජයට /වෙනත් පළාත් සභාවකට /පළාත් සභාවේ වෙනත් කාර්යාලයකට ස්ථාන මාරුවී ගිය නිලධාරින්ගෙන් අයවිය යුතු ණය ශේෂ - විදේශ ධූත සේවය සඳහා | | | |
| 12 | එම්.එච්.ගුණසේකර | කළමනාකාරණ සේවා නිලධාරි | 2020.02.07 | 92,200.00 |
| | | රු.7,800/- බැගින් කාර්තු වශයෙන් ණය වාරික නිරවුල් කරනු ලබයි. | | |
| | සේවය හැර ගොස් ඇති නිලධාරින්ගෙන් අයවිය යුතු ණය ශේෂ | | | |
| 13 | ආර්.ඒ.එම්.එම්.රණසිංහ | තාක්ෂණ නිලධාරි | 2013.01.15 | 119,6   9.00 |
| | | තවද කඩුවෙල සමථ මණ්ඩලයට යොමු කර 2024.01.27 හා 2024.02.24 දෙදිනම මෙම නිලධාරියාව කැඳවුවද එම දින දෙකෙදීම සමථ මණ්ඩලය වෙත නොපැමිණීම මත සමථ මණ්ඩලය විසින් 1988 අංක 72දරන සමථ මණ්ඩල පනත අනුව සමථ කිරීමෙන් ආරවුල හෝ වරද නිරවුල් නොකිරීමේ සහතිකයක් ලබා දී ඇති අතර එම සහතිකය නීති නිලධාරි වෙත අංක:CSWP/ENG-ADM/26-8/FI/1 හා 2024.02.29 දිනැති ලිපියෙන් යොමු කරන ලද ලිපියට අනුව මෙම තොරතුරු නීති නිලධාරිගේ අංක: CSWP/ENG-LEG/10-3/FI/30 හා 2024.03.01 දිනැති ලිපියෙන් ගරු නීතිපතිතුමා වෙත යොමු කර ඇත. මේ සම්බන්ධයෙන් පසු විපරම් කිරීමට තීරණය විය. | | |

| | | | |
|---|---|---|---|
| 03 | කල් ඉකුත්වූ තැන්පතු | 2024.05.31 දිනට ගම්පහ ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලයේ වසර දෙක ඉක්ම වූ තැන්පතු 05 ක් පැවති අතර එම තැන්පතු හැකි ඉක්මනින් නිරවුල් කිරීමට කටයුතු කරන ලෙස උපදෙස් දෙන ලදි.<br><br>මේ වනවිට වසර දෙක ඉක්ම වූ තැන්පතු නිරවුල් කර ඇති අනෙකුත් ප්‍රාදේශීය ඉංජිනේරුවරුන්ට මේ සම්බන්ධයෙන් නි.ප්‍ර.ලේ.(ඉංජිනේරු) විසින් ස්තුති කරන ලදි. | නි.ප්‍ර.ලේකම් (ඉංජිනේරු)<br><br>ප්‍රධාන ගණකාධිකාරි / ගණකාධිකාරි /<br><br>සියලුම ප්‍රාදේශීය ඉංජිනේරු |

| | | | |
|---|---|---|---|
| 04 | මීගමුව ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලය (නව සහ පැරණි පිහිටි භූමිය බස්නාහිර. පළාත් සභාවට පවරා ගැනීම | • මීගමුව ප්‍රාදේශීය ලේකම් හා ප්‍රාදේශීය ඉංජිනේරු (මීගමුව) විසින් හුවමාරු කර ගෙන ඇති ලිපිවලට අනුව මීගමුව නව ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලය සහ පැරණි ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලය පිහිටි භූමියන් බස්නාහිර පළාත් සභාවට පවරා ගැනීම සඳහා මැනුම් ගාස්තු 2024.03.21 මැනුම්පති වෙත යවා ඇති බවත්.<br><br>• අදාල මැනුම් ගාස්තු ගෙවන ලද බවත් ඒ අනුව ඉඩම් පවරා ගැනීම් කටයුතු කඩිනමින් සිදු කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස මීගමුව ප්‍රාදේශීය ඉංජිනේරුගේ අංක:CSO/ENG/13/5 හා 2024.04.22 ලිපියෙන් මීගමුව ප්‍රාදේශීය ලේකම් දැනුවත් කල බවත්<br><br>මැනුම්පති විසින් මැනුම් කටයුතු සිදුකරන ලෙස ජාඇල මිනුම්දෝරු වෙත දන්වා ඇති බවත්, එහි සේවයේ නියුතු නිලධාරීන් උසාවි යාමට ඇති බැවින් කඩිනමින් මෙම මැනුම් සිදුකිරීම සඳහා කණ්ඩායමක් එවීමට අපහසු බව ප්‍රකාශ කළ බවත් මීගමුව ප්‍රාදේශීය ඉංජිනේරු විසින් ප්‍රකාශ කරන ලදි.<br><br>මේ සම්බන්ධයෙන් කඩිනමින් මැනුම් කටයුතු සිදුකර ගැනීමට පසු කටයුතු සිදු කරන ලෙස මීගමුව ප්‍රාදේශීය ඉංජිනේරුට නි.ප්‍ර.ලේ.(ඉංජිනේරු) විසින් උපදෙස් දෙන ලදි. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) / පරිපාලන නිලධාරී/ මීගමුව ප්‍රාදේශීය ඉංජිනේරු |
| | අවිස්සාවේල්ල ඉඩම | 2.1. 2023.11.22 දින ප්‍රධාන ලේකම් (බ.ප.)ගේ ප්‍රධානත්වයෙන් පැවති රැස්වීමේදී ගත් තීරණ පරිදි හෝමාගම ප්‍රාදේශීය ඉංජිනේරු විසින් අංක:SCO/ENG/5/04/CMSO/Qua/2024 හා 2024.05.06 දිනැති ලිපිය මඟින් උක්ත ඉඩම සහ ගොඩනැගිලි පරිශ්‍රය 2024.05.21 දිනට පෙර බස්නාහිර පළාත් ඉංජිනේරු කාර්යාංශය වෙත භාර දීමට කටයුතු කරන ලෙස දන්වා ඇත.<br>ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයේ සභාපති විසින් මෙම ගොඩනැගිලි පරිශ්‍රය තව මසක කාලයකට කල් ඉල්ලූ බව හෝමාගම ප්‍රාදේශීය ඉංජිනේරු ප්‍රකාශ කරන ලදි.<br>මෙම ගොඩනැගිල්ල නැවත ඉංජිනේරු කාර්යාංශයට භාරදීම සම්බන්ධයෙන් පරිපාලන නිලධාරිණිය විසින් සභාපති සමඟ දුරකථනයෙන් විමසා ඇති අතර එහිදී 2024 ජූනි මස අවසන් වීමට පෙර සබරගමුව ප්‍රාදේශීය කාර්යාලය ස්ථාපිත කිරීමට ගොඩනැගිල්ලක් බදු පදනම මත ලබා ගැනීමට නොහැකිවී වූ බැවින් දැනට නාගරික සංවර්ධන අධිකාරිය විසින් ඉදිකිරීම් අවසන් කරමින් පවතින කෑගල්ල පරගම්මන ඩිපෝ ගොඩනැගිල්ල 2024.07.15 දින වන විට ශ්‍රී ලංගම වෙත ලැබීමට නියමිත බැවින් එතෙක් මෙම ගොඩනැගිල්ලේ රැදී සිටීමට අවරස ඉල්ලා ඇති අතර එම ඉල්ලීම ලිඛිතව එවන බවත් ප්‍රකාශ කර ඇත.<br>සභාපතිගේ ඉල්ලීම පරිදි නියමිත දිනට ගොඩනැගිල්ල බාරනොදුන හොත් ඒ සම්බන්ධයෙන් ප්‍රධාන ලේකම් සමඟ රැස්වීමක් කැඳවීමට තීරණය විය.<br><br>2.2. බස්නාහිර පළාත් ඉංජිනේරු කාර්යාංශයට අයත් සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් පරිහරණය කරන නිල නිවාස සම්බන්ධ ඉඩම් කොටස් සඳහා මැනුම් නියෝග ලබා ගැනීමට සීතාවක ප්‍රාදේශීය ලේකම් දැනුවත් කර ඇති බව හෝමාගම ප්‍රාදේශීය ඉංජිනේරු විසින් දන්වා ඇත. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) / පරිපාලන නිලධාරී/ හෝමාගම ප්‍රාදේශීය ඉංජිනේරු |

| | | | |
|---|---|---|---|
| 05 | ලිපිගොනු කළමනාකරණ ක්‍රියාවලිය සම්බන්ධ මෘදුකාංග පද්ධතිය (DMS) | ඒ අනුව මෙම ලිපිගොනු කළමනාකරණ ක්‍රියාවලිය සම්බන්ධ මෘදුකාංග පද්ධතිය (DMS) ප්‍රධාන කාර්යාලයේ ප්‍රාදේශීය කාර්යාලවල මේ වනවිට ක්‍රියාත්මක වන අතර, Process Automation ක්‍රියාවලියේ තවදුරටත් අඩුපාඩු පවතින බැවින් මෙම අඩුපාඩු විසදීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග සිදු කරන ලෙසත්, Epic Lanka Technologies (Pvt)Ltd ආයතන සමඟ ඇති කරගත් ගිවිසුම සම්බන්ධයෙන් ගැටළුකාරී තත්ත්වයක් මතුවූ බැවින් එහි List of Deliverables පරීක්ෂා කිරීම සඳහා සම්පූර්ණ ගිවිසුමෙහි පිටපතක් ද ලබාදෙන ලෙසත්, ඉල්ලා නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු)ගේ අංක:CSWP/ENG-ADM/55-1/FI/01/(A) හා 2024.05.16 දිනැති අධ්‍යක්ෂ, තොරතුරු තාක්ෂණ සම්පත් සංවර්ධන අධිකාරිය (බ.ප.) වෙත ලිපියක් ඉදිරිපත් කරන ලද බවත්, අධ්‍යක්ෂ ඉංජිනේරු පැහැදිලි කරන ලදි.<br><br>Process Automation System යොදාගෙන රාජකාරි කටයුතු කිරීම ගැටළුකාරී වන බැවින් ඒ සම්බන්ධයෙන් එම රාජකාරි පහසුකරවීමට තොරතුරු තාක්ෂණ සම්පත් සංවර්ධන අධිකාරියේ නිලධාරියකු මෙම කාර්යාංශයට අනුයුක්ත කරන බව තොරතුරු තාක්ෂණ සම්පත් සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ප්‍රකාශ කල බව නි.ප්‍ර.ලේකම්(ඉංජිනේරු) පැහැදිලි කරන ලදි. එම නිලධාරියාගේද සහයෝගය ඇතිව මෙම මෘදුකාංගය කරගෙන යාමට නොහැකි වුව හොත්, මෙම මෘදුකාංග පද්ධතියකින් රජකාරි පහසුකරවීමක් , සේවක ශ්‍රම දායකත්වයට අවම කිරීමට හැකියාවක් නොමැති බව පෙනීයන්නේ නම් ගිවිසුම් ප්‍රකාරව අදාල ආයතනය සමඟ සාකච්ඡා කර මෙම මෘදුකාංග මෙම කාර්යාංශයට ඵලදායි, කාර්යක්ෂම ක්‍රියාවලියක් නොවන්නේ නම් මෙම මෘදුකාංගය නතර කිරීම සම්බන්ධයෙන් ක්‍රියා කිරීමට තීරණය විය. | නි.ප්‍ර.ලේ. ඉංජිනේරු/ අධ්‍යක්ෂ ඉංජිනේරු / ගොඩනැගිලි අධ්‍යක්ෂ |
| | | | |

**2 ) විගණන අධිකාරිගේ අදහස් හා පැහැදිලි කිරීම්**

| | මතුකළ කරුණු |
|---|---|
| 1 | කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමේදී තරඟකාරී මිල ගණන් යටතේ ලබාදීම වඩාත් යෝග්‍ය බවත්, සමිතිවලට කොන්ත්‍රාත් ලබා දෙනවාට වඩා රජයට වාසිදායක බවත් පෙන්වා දෙන ලදි. |
| 2 | පාසැල්වල ඉදිකිරීම් සිදු කිරීමේදී පාසැල් කිහිපයක ඉදිකිරීම් හෝ නඩත්තු කටයුතු කොටස් වශයෙන් සිදු නොකර එක් පාසැලක ඉදිකිරීම් හෝ නඩත්තු සිදු කර අවසන් කිරීම වඩා සුදුසු බව. |
| 3 | DMS මෘදුකාංගය ක්‍රියාකාරී තත්ත්වයට පවත්වාගෙන යාමට විශාල කාලයක් ගත වී ඇතත් මෙතෙක් නිසි පරිදි ක්‍රියාත්මක නොවන බැවින් මේ සම්බන්ධයෙන් සොයාබලා කඩිනමින් ක්‍රියාකර හැකි ආකාරයට සකස්කර ගැනීමට කටයුතු කරන ලෙසත් |
| 4 | අවධානම් සහගත කඩිනමින් සිදු කළ යුතු පාසැල්වල ඉදිකිරීම් වැඩ සඳහා ප්‍රමුඛතාවය ලබාදීම සිසුන්ගේ ආරක්ෂාව වඩා සුදුසුබව |

(3) අධ්‍යක්ෂ අභ්‍යන්තර විගණනකගේ අදහස් හා පැහැදිලි කිරීම

| | මතුකළ කරුණු |
|---|---|
| 1 | බැංකු සැසඳුම් නියමිත දින වන විට විගණනය වෙත ඉදිරිපත් කරන බවත් ඉදිරියටත් එලෙසම සිදු කරන ලෙසත් |
| 2. | මාසය අවසානයට මුදල් පොතේ ශේෂය අවම මට්ටමක පවත්වාගෙන යන බවත් ඒ ආකාරයෙන් දිගටම පවත්වාගෙන යන ලෙසත්. |
| 3. | බත්තරමුල්ල ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලයේ 2023 නොවැම්බර් මස සිට හඳුනා නොගත් ගෙවීම් දෙකක් පවතින බව, කාලය ගතව ඇති බැවින් මේ සම්බන්ධයෙන් කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කරන ලෙස, |
| 4. | ඉදිකිරීම් ඇස්තමේන්තු සකස් කිරීමේදී අඩුපාඩු අවම වන පරිදි සකස් කිරීමට දැඩි අවධානය යොමු කරන ලෙස |
| 5. | අතුරු විගණන විසඳුම් ඡේද 05 ක් (හොරණ, ගම්පහ, රත්මලාන,)ඇති බවත් එ සඳහා හැකි ඉක්මනින් පිළිතුරු ඉදිරිපත් කරන ලෙස |

අධ්‍යක්ෂ - ගිණුම් හා ගෙවීම්ගේ අදහස් හා පැහැදිලි කිරීම

| | මතුකළ කරුණු |
|---|---|
| 1 | පළාත් භාණ්ඩාගාරය සතුව වියදම් සඳහා මුදල් ඇතත් එම මුදල් වියදම් නොවී පවතින බව, වැඩිපුරම මුදල් පාවිච්චි වන්නේ ඉංජිනේරු කාර්යාංශය හරහා බැවින් හා අධ්‍යාපන හා සෞඛ්‍ය ඉදිකිරීම් සඳහා සල්ලි වෙන්වුවත් ඉංජිනේරු කාර්යාංශයෙන් අවසන් වැඩ කොටස සිදුකර බිල්පත් ඉදිපත් කලහොත් පමණක් මෙම මුදල වැය කලහැකි වන බවත්, PSSP, PSDG, CBG ව්‍යාපෘති සඳහා මහා භාණ්ඩාගාරයෙන් ලැබෙන් මුදල් වියදම් කළ බවට මාසික ගිණුම් සාරාංශය මඟින් අදාල වියදම් වාර්තා ඉදිරිපත් නොකළ හොත් නැවත මහ භාණ්ඩාගායෙන් මුදල් ඉල්ලීමට නොහැකිවී ඇති බැවින් හැකි ඉක්මනින් වැඩ අවසන් කර ගෙවීම් සිදු කිරීමට කටයුතු කරන ලෙස පැහැදිලි කරන ලදි. |

විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම පවත්වා අදාල කරුණු සාකච්ඡා කිරීම ඉතා වැදගත් බවත්, එම කරුණු සම්බන්ධයෙන් විගණනයෙන් ලබාදෙන ලද වටිනා අදහස් රාජකාරි කටයුතු වලදී ඉතා ප්‍රයෝජනවත් බවත්, ඔබගේ වටිනා කාලය වැයකර මෙම රැස්වීම සඳහා සහභාගි වීම සම්බන්ධයෙන් විගණන අධිකාරී, අධ්‍යක්ෂ - අභ්‍යන්තර විගණක, භාණ්ඩාගාර නියෝජිත අධ්‍යක්ෂ(ගිණුම් හා ගෙවීම්), පැමිණි සියළුම ප්‍රාදේශීය ඉංජිනේරුවරුන්ට හා අනෙකුත් සහභාගි වූ සියළු නිලධාරින්ට නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) ස්තුතියපල කිරීමෙන් අනතුරුව රැස්වීමේ කටයුතු පස්වරු 11.45 ට පමණ අවසන් කරන ලදි.

ඉංජි.කේ.ආර්.අබේසිරිවර්ධන
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු),
පළාත් ඉංජිනේරු කාර්යාංශය,
බස්නාහිර පළාත.

දුරකථන අංකය : 0112092524
ෆැක්ස් අංකය : 0112092523
විද්‍යුත් ලිපිනය : eng.org.acc@gmail.com